

# ඉක්මන් මැලවීමෙන් ගම්මිරිස් වගාව රැකගන්න





Pepper

DISEASE

+ 94 812 388651
direxag@sltnet.lk
www.dea.gov.lk

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095, ගැටඹේ, පේරාදෙණිය.

# ඉක්මන් මැලවීම (Quick Wilt) යනු

**වැල හදිසියේ මැලවී පත්‍ර හා පර්ව හැලී යාමයි. මෙය බොහෝ සෙයින් දැකිය හැකි වන්නේ තද වැසි කාලවලට පසුව එළඹෙන වියළි කාලයේය.**





## රෝග ලක්ෂණ

මෙම රෝගය පයිටොප්තරා කැප්සිසී (Phytopthora Capsici) නැමැති දිලීරය ආසාදනය වීමෙන් ඇතිවේ. රෝග ආසාදනය මූල පද්ධතිය ආශ්‍රිතව සිදුවූවත් එම ක්‍රියාවලිය පසතුල සිදුවන බැවින් මුල් අවස්ථාවේදී රෝග ලක්ෂණ පියවී ඇසින් දක්නට නොලැබෙන අතර, පසුව පහත සඳහන් රෝග ලක්ෂණ වැලේ පත්‍ර සහ කඳ ආශ්‍රිතව දක්නට ලැබේ.





- **පත්‍ර කහ පැහැවීම**
- **කහ පැහැවූ පත්‍ර මත තද කළු පැහැති පැල්ලම් තිබීම**
- **වැල මැළවී පත්‍ර සහ පුරුක් හැලී යාම**
- **රෝගය වැළඳීමෙන් පසු සති 2-3 ක් අතර කාලයේදී වැල මිය යාම**

## රෝග පාලනය

**රෝග ලක්ෂණ නිරීක්ෂණය වූ පසු හැකි ඉක්මනින් නිර්දේශිත පාලන ක්‍රම අනුගමනය කිරීම රෝග පාලනය සඳහා ඉතා වැදගත් වේ.**

- ක්ෂේත්‍රයේ හොඳින් ජලය බැස යාමට සැලැස්වීම
- වැසි කාලයේදී සෙවන අඩු කිරීම වැල් වටා ඇති වසුන් ඉවත් කිරීම
- වැසි කාලයේදී වැල් වටා ඇති වල් මර්දනය කිරීම
- පොළොව මට්ටමේ සිට අඩි 1.5 ක් පමණ උසට ඇති හරස් අතු ඉවත් කිරීම
- ආසාදනය වූ අතු හා මුල් කොටස් ඉවත් කර පුළුස්සා දැමීම











- ආසාදිත වැල් සහ ඒ අවට ඇති නීරෝගී මුල් වල පාමුල මැන්කෝසෙබ් 64%, මෙටලැක්සිල් 8% අඩංගු දිලීර නාශකයකින් ග්‍රෑම් 25 ක් වතුර ලීටර් 10 ක දියකර ලැබෙන මිශ්‍රණයෙන් හොඳින් තෙමීම.
  (එක් වැලකට මිශ්‍රණයේ ලීටර් 3-4 ක් පමණ) ඉහත ප්‍රතිකාරකය සති දෙකකට පසු නැවත වරක් යෙදිය යුතුය.

## සියළු විමසීම්

- රෝගය පාලනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම සහ උපදෙස් නොමිලේ....
- පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර දින සහ ක්ෂේත්‍ර ආදර්ශන පැවැත්වීම...
- රෝගය හඳුනා ගැනීමට නොහැකි අවස්ථා වලදී අදාල ක්ෂේත්‍රයට ගොස් රෝගය හඳුනා ගැනීමට කටයුතු කිරීම සහ රෝග පාලනයට අවශ්‍ය උපදෙස් ලබාදීම
- රෝගී සාම්පල නොමිලේ විශ්ලේෂණය කර වාර්තාවන් ලබාදීම


**මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය**
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
මාතලේ.
දුරකථන-066-2222822 / 066-2231249

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (ප්‍රධාන කාර්යාලය)**
1095, ගැටඹේ, පේරාදෙණිය.
දුරකථන- 081-2388651 /081-2386018


වැඩි විස්තර දැනගන්න **විමසන්න**

**අපනයන කෘෂිකර්ම ව්‍යාප්ති නිළධාරී**
සෑම බදාදා දිනකම ප්‍රදේශයේ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දී

**සහකාර අධ්‍යක්ෂ**
අපනයන කෘෂිකර්ම දිස්ත්‍රික් කාර්යාල වල දී


**සැකසුම :-**
පැළෑටි සංරක්ෂණ ඒකකය -මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මාතලේ

**නිර්මාණය**
මාධ්‍ය හා සන්නිවේදන අංශය
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - ප්‍රධාන කාර්යාලය

Google Play | DEA

**Designed @** COM & MEDIA div | DEA by **PRASANNA THILAKARATHNA**